# ප්‍රීතිමත් ගමන

## කාන්තා මිත්‍ර සංගමය

### ජනවාරි මස සිට මාර්තු 2024



## සභාපතිනියගේ ආවර්ජනය

2024 පළමු මාස හතර ගැන මා හැරී බලන විට මාගේ හද ගැඹරු ලෙස ප්‍රීතියෙන් පිරෙන අතර, ශ්‍රී ලංකා කාන්තා මිත්‍ර සංගමය දිගින් දිගටම ඉදිරියට සහ ඉහලට යන මා දැකිම ප්‍රීතියකි. මෙම කාලපරිච්ඡේද තුල ඉතා ජවසම්පන්නව හා දිගුකාලිනව කෙරුනාවු සේවයේ ප්‍රීතිය ඉතාම අලංකාර ලෙස මෙම පුවත් පත්‍රිකාවෙ පළිබිඹු වන්නේය.

අපට මඟපෙන්වන්නේ බලපෑම්වලින් පූර්ණ ආශ්වාදජනක මුලපිරිමක් සහ නොසැලෙන ඇදහිල්ලයි. අපි මෙමෙ ජයග්‍රහණය සමරන අවස්ථාවන්වල දෙවියන්වහන්සේ වෙනුවෙන් අපගේ හදවතේ කෘතඥතාවය පිරි ඉතිරි යන්නේය“ හිතෝපදේශ 3 : 5-6 වන පදය අනුව අපේ ගමන අලංකාර ලෙස විග්‍රහ කරන්නේය.

නුඹේම නුවණෙහි නොපිහිටා, නුඹේ මුළු සිතින් ස්වාමින්වහන්සේ කෙරෙහි විශ්වාස කරන්න. නුඹෙ සියලු මාර්ගවලදි උන්වහන්සේ සලකන්න, එවිට උන්හහන්සේ නුඹේ මාවත් සමතලාකරනවා ඇත.

කොළඹ මුලස්ථානයේ මෙන්ම පිටපලාත්වල දක්ෂ කණ්ඩායමක් සිටිම සත්‍යවශයෙන්ම අපි ලැබූ ආශිර්වාදයක්ය. මෙම අයගේ නොසැලෙන කැපවීම සහ හදවතේ ආශාවයි මෙම සමාජය ඉදිරියට රැගෙන යාම සඳහා අනුබල දෙන්නාවු

ශ්‍රිලංකා කාන්තා මිත්‍ර සංගමය 2026 දි ලෝක කවුන්සිලයේ සත්කාරය සඳහා උද්යොගමත් ගමනක් ආරම්බ කර ඇත. මෑතකදි සිදුවුනාවු හදිසි ආපදාව එනම් ජලගැල්ම අවස්ථාවෙදි ත්‍යාගශිලිවන්තව උපකාර කලාවු සාමාජිකයින් වෙනුවෙන් අපගේ හදවතේ ස්තුතිය පිරිනමන්නෙමු. අව්‍යතාවය තිබෙන අය වෙනුවෙන් උපකාර කිරිමෙහිලා ඔබගේ දයාව හා අනුකම්පාව සමාජයට ආදර්ශමත් සහ සාරවත් දෙයකි.

මෙය කියවා, පසු ගිය මාස කීපයතුල ලැබුවාවු කැපිපෙනෙන ජයග්‍රහනය මෙම සඟරාව තුලින් බෙදා ගනිමු. මෙම කාන්තා මිත්‍ර සංගමය සමඟ ඔබේ ගමන ඉමහත් ප්‍රීතියක් ඇතිකිරිමේ මුලාශ්‍රයක් වේවා!

උණුසුම් සුබපැතුම්
රෝහිණී රත්නම්

## දෙවියන් වහන්සේ සමඟ කමනක්



Eglah Tinisha Kamalenthiran
A junior member – GFS Colombo

මට වයස අවු:5ක් වන විට මම විශාල ශල්‍යකර්මයකට භාජනය විමෙ අත්දැකිමක් ඇති යොවුන් වියේ දැරියකි. මම අවුරුදු දෙකක් මගේ දෙමාපියන් සමඟ නයිජිරියාවේ ජිවත්වුනෙමි. මම අධික්‍රියාකාරි බවත් නිතර දහඩිය දමන බව මාග් දෙමපෙයන් සොයා ගන්නාතුරු සියලු දේ හොඳින් සිදුවිය. මේනිසා මාව වෛද්‍ය වරුන් වෙත යොමුකල විට වෛද්‍යවරුන් පවසා සිටියේ මම සම්පුර්ණ නිරෝගි තත්වයක සිටින බවයි. දිනේ දින ගෙවී ගියේය. නමුත් සාමාන්‍ය තත්වයට වඩා මගේ හෘදස්පන්දනය වැඩි වුනේය, නයිජිරියාවේ වෛද්‍ය පහසුකම් ප්‍රමානවත් නොවු බැවින් ප්‍රතිකාර සඳහා මගේ පවුලේ අය සහ මමද නැවත ශ්‍රී ලංකාවට පැමිණියෙමු.

මාව යොමු කල හෘද රෝග විශේෂ වෛද්‍යවරයා, මගේ හදවතේ සිදුරක් තිබෙන බව හඳුනා ගත්තාය. මගේ ජිවත්විමේ බලාපොරොත්තු බෙහෝ වෛද්‍යවරුන්ට නැතිවුන බැවින් මගේ පවුලේ අය බෙහෝ කනස්සල්ලට පත්වුනෝය. ඔවුන්ගේ එකම බලාපොරුත්තුව වුයේ සර්වබලධාරි සේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුලය. මගේ ශල්‍යකර්ම දවසෙදිත් මගේ දෙමාපියන් හියට පත්ව සිටියෝය“ නමුත් දෙවියන්වහන්සෙගේ උපකාරය ඔවුනට ධෛර්යය ලබාදුන්නේය දෙවියන්වහන්සේ කිසිවිටක උන්වයන්සේගේ ආදරණියන් අත්නාරිනසේක” යනුවෙන් වාක්‍ය ඛාණ්ඩයක් ඇත. මගේ ශල්‍යකර්මය සාර්ථක වන බවට මගේ පවුලට යේසුස්වහන්සේ සහතිත කලා. මගේ සාක්ෂිය ජවසම්පන්න, මුලුමනින්ම සහ බලවත්ලෙස ලෙෂ සෑම දෙනා සමඟ බෙදාගන්නෙමි. මෙය මගේ ජිවිතයේ සිදුවුනාවු එක් හාස්කමකි. උන්වහන්සේ අප දෙස බලා, මඟ පෙන්වා ආරක්‍ෂා කරනසේක. ඔබගේ එකම බලාපොරොත්තු අත්නොහරින්න“

**ස්වාමින් වහන්සේට ප්‍රසංගා වේවා.**

## 'අපි ඔබගේ ඇස් ගැන සලකමු' - අක්ෂි සායනය දික්කෝය

සහය වන ක්‍රම සහ විධි සොයමින් දිළිඳු සහ අගහිඟකම් ඇති ප්‍රජාවට සහය වීමට කාන්තා මිත්‍ර සංගමය අපෙක්ෂා කරයි. ශ්‍රී ලංකා දුෂ්කර ප්‍රදේශවල අක්ෂි සෞඛ්‍ය මහජන සෞඛ්‍ය අභියෝගයක් ලෙස පවතී“




පළමු අක්ෂි කඳවුර මාර්තු මස 23 වන දින ක්‍රිස්තුස් දේවස්ථානය දික්ඔය, ඉතාම සාර්ථක අන්දමින් පැවැත්වුනි. සහභාගිවු 122 දෙනා සඳහා දික්ඔය ක්‍රිස්තුස් දේවස්ථානයේදි කණ්නාඩි පරිත්‍යාග කිරිම වෙනුවෙන් සමරසිංහ අක්ෂි වෛද්‍යවරුන්ට සහ නයෝමි ගුරුසිංහ මහත්මියට සහ කාන්තා මිත්‍ර සංගමයේ උඩ රට ප්‍රදේශයේ දේවගැති එස්. කේ. ඩෑනියල්, සභාවේ කාන්තා මිත්‍ර සංගමයේ ශාකා සාමාජිකයින් සමඟ ඒකාබද්ධ මූල්‍ය අනුග්‍රහය සඳහා සර්වි නව් ආයතනයට අපගේ ස්තුතිය පිරිනමමු. මෙම අක්ෂි කඳවුර සඳහා කාන්තා මිත්‍ර සංගමයේ විධායක සභාවේ සමාජිනයින් තිදෙනෙකු සහ ප්‍රධාන විධායක නිළධාරිණී ද සහභාගි විය. සැත්කම කල යුතු අවශ්‍යම වැඩිහිටි යුවලකට සාමාජිකයෙක් රු 50,000 ක පරිත්‍යාගයක් දැනටම අප වෙත ලැබී ඇත. අපගේ මීලඟ ප්‍රතිලාභින්ගේ සාර්ථක කථා කියවීමට බලාපොරොත්තු වන්න.





## ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම

ලොව මුළුල්ලේම කාන්තාවන්ගේ සහ ළමුන්ගේ ජීවිතවල වෙනසක් ඇතිකරීම කාන්තා මිත්‍ර සංගමයේ විෂේශ කාර්යයක් කොට සලකන්නේය. මෙම අංශයට විශේෂ අවධානයක් යොමු කිරිමට අවශ්‍යය බැවින් ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම වෙනුවෙන් මාර්තු මස 8 වන දින කැප කොට ඇත. කාන්තා මිත්‍ර සංගම් ශාඛාවන්හිද විවිධ වැසටහන් පැවැත්විය.

**2024 මාර්තු 17**

**සියලු ශාන්තුවරයන්ගේ දේවස්ථානය, අගරපතන**
**සියලු ශාන්තු වරුන්ගේ දේවස්ථානය, මස්කෙලිය**
**ශාන්ත මරියතමයගේ දේවස්ථානය, බොගවන්තලාව**
**යොහාන් බෞතිස්ත දේවස්ථානය, වටවල**

මෙම වැඩසටහන්වලදි අදාළ මාතෘකා ඔස්සේ සභාපතිවරුන් හෝ නිලධාරි මණ්ඩලය අදහස් දැක්වීම විශේෂත්වයකි“ සියලුම ශාඛාවන්වල විවිධ ක්‍රිඩාවන් තිබුන අතර තේ සංග්‍රහයටද සහභාගි වෙමින් වැඩසටහන් පුරාවටම විනෝද වුනෝය.




**18 මාර්තු 2024**

කොල්ලුපිටියේ ජීවත්වන අඩු ආදායම් ලාභි කාන්තාවන් 22 දෙදෙනෙකු වෙනුවෙන් කොළඹ මුලස්ථානයේ වැඩ සටහනක් පවත්වන ලදි. එදිනම අපි කොළකැඳ ව්‍යාපාරයද ආරම්භ කරමින් පැමිණ සිටි අයට නොමිලේ කොළ කැඳ කෝප්පයකින් සංග්‍රහ කරන ලදි. මෙමෙ කාන්තාවන්හට දේශනයක් දෙන පිනිස අත්දැකීම් බහුල ළමා විශේෂඥ වෛද්‍ය ප්‍රයන්ති මොල්ලිගොඩ මහත්මියට ආරාධනා කරන ලදි. වැඩසටහනේ අරමුණ වුයේ දරුවන් සම්බන්දව තිබෙන්නාවු වැරදි වැටහිම් සහ මිත්‍යාමත ගැන දැනුවත් කරීමයි“ එමෙන්ම සෞඛ්‍ය සම්පන්න ජිවිතයක් ගතකරන්නට ගතයුතු පියවරවල් සමබන්දවද වැඩිදුරටත් පැහැදිලි කල අතර ඉතාම වැදගත් අත් පත්‍රිකාද බෙදා දෙන ලදි.



# දරුවන් දිරි ගැන්විම හා විවේක කාලයක් ලබා දිම ශාන්ත මාර්ක් තුමාගේ දේවස්ථානය බදුල්ල



2024 වසර පාසැල් ආරම්භයට පෙර දරුවන්ව දිරිගැන්විමට සහ ඔවුන්ට විවේකයක් ලබා දිම සඳහා ගරු මංජුකා පූජකතුමිය වැඩසටහනක් සංවිධානය කලාය. සහභාගි වූ දරුවන් ප්‍රධාන වශයෙන් වතුකරයෙන් වන අතර ඔවුන් අවුරුදු 6 න් පහළ සහ අවුරුදු 16 යෙන් ඉහල සිංහල හා දමිල දරුවන්ය. කණ්ඩායම් දෙකකට බෙදන ලදි.

# හදිසිගංවතුර සහනාධාර

**හම්බන්තොට:** එක් පවුලකට රුපියල් 2,500ක වටිනාකමකින් යුත් වියලි ආහාර මල්ලක් ලබාදෙන ලදි. මඩකලපුව ශාන්ත ඇන්ඩෘ දේවස්තානයේ පවුල් 25 කට වියලි අහාර මල්ලක් බෙදා දෙන ලදි. එම ආහාර මල්ලක වටිනාකම රුපියල් 2000ක් විය මයිලම්බාවෙලි මඩකලපුව ශාන්ත පාවුලු දෙවස්ථානයට අයත් පවුල් 36කට පරිප්පු කිලෝ 1ක් සහ සෝයා ගෑම් 250 ක බඩු මල්ලක් දෙන ලදි.








# ඔපරේෂන් ජෝසෆ් (Operation Joseph) හා එක්ව සිදුකරන ලද කාන්තා මිත්‍ර සංගමයේ ගෙවතු වගා ව්‍යාපෘතිය.

ක්‍රිස්තුස් **දේවස්ථානය** දික්ඔය, ශාන්ත මරියා **දේවස්ථානය** බොගවන්තලාව, සියලු ශාන්තවරුන්ගේ **දේවස්ථානය** මස්කෙලිය, සහ ජෝන්ද බැප්ටිස්ට් වටවල යන **දේවස්ථානවල** ප්‍රතිලාභින් 55 දෙනෙකුට පැල බෙදා දෙන ලදි. කොටගල ගාන්දි ගොවිපළෙන් බීට්රූට්, ලීක්ස්, තක්කාලි, බටු, සලාද කොල, සහ අමුමිරිස් යනපැල වර්ග 6 මිලයට ගෙන බෙදා දෙන ලදි.

ඉදිරි දවස් දෙක ඇතුලත බෙදා දිමට නියමිතව තිබුන මෙම පැල 55ම කාන්තා මිත්‍ර සංගමයේ සභාපතිනිය, උප සභපතිනිය සහ භාණ්ඩාගාරික තුමියන්ගේ සහයේගය ඇතුව මෙම එළවලු පැල සුදානම් කරිම අනර්ග කා්ර්‍යයක්ය" ප්‍රතිලාභින්ව ඇමතිම සඳහා ගිනිගත්හෙනේ ප්‍රාදේශිය ලේඛම් කාර්යාලයට අයත් කෘෂිකර්ම කාර්යාල භාර රෆයිදින් මහත්මයාව සම්බන්ද කිරිමේ කටයුත්ත කලාප සම්බන්ධිකාරක නිලධාරිනි විසින් කරන ලදි. පැලවර්ග සාත්තුකරන ආකාරය ගැන එතුමා පැහැදිලිව විස්තර කලාය. කාන්තා මිත්‍ර සංගමය ශාඛාවන්ට වෙනුවෙන් එතුමාගේ සේවය සහ සහයද එතුමා විසින්ම පිරිනමන ලදි. මෙ වෙනුවෙන් කුඩා කණ්ඩායම් හරහා වැඩ කරන්නට සහ උය්ව්වව කණ්ඩායම් නිර්මානය කරන්නට බලාපොරුත්තු වන්නෙමු.




සමහරක් ප්‍රතිලාභින් කෘෂිකර්ම කාර්යාල භාර නිධලාරි රුෆයිඩින් මහතා සම.

## ක්‍රියාකාරී ව්‍යාපෘතීන් - මාතලේ ආයුර්වේද වෛද්‍ය සායන




ඔධ්‍යම පළාතට අයත් මාතලේ දිස්ත්‍රිකයේ දුෂ්කර පළාත්වල කාන්තා මිත්‍ර සංගමය හරහා ආයුර්වේද වෛද්‍ය සායන ගනනාවක් පවත්වන්නට හැකිවුනි. මාතලේ කාන්තා මිත්‍ර සංගමයේ ශාකා සභාව වන ක්‍රිස්තුස් දේවස්ථානයේ නායකත්වය දරණ රෝහිණී රණසිංහ පුජකතුමිය යටතේ සිදුකෙරුනාවු මුලපිරීමක්ය. ඔයසි සි 'බ සබසඑස්එසඬැ දෙ එයැ ඨ්ඡි ඊර්බජය සබ සයරසිඑ සයමරජය ඒඒකැ මබාැර එයැ කඨැරියසව දෙ සෑඬග සෑදයසබස සඃබීසබටයැ® දුප්පත් සහ අවශ්‍යතා තිබෙ අය වෙනුවෙන්ම මෙම කාර්යය සංවිධානය කිරීමේ විශේෂ ක්‍රියාව මෙතුමිය විසින් මෙම සායනය කරනු ලැබුවේ ආයුර්වේදි වෛද්‍ය දිස්ත්‍රික් ලේඛම් අංශයේ වෛද්‍යවරයා සහ හෙදසේවිකාවක් විසිනි. මුල්‍යම ප්‍රතිපාදනය වෙනුවෙන් අනුග්‍රය දැක්වු ්:ැරඬැහදඅ- සර්ව් නව් ආයතනයට බෙහෙවින් කෘතඥ වන්නෙමු. ජනවාරි මස ඉම්බුල්ගෙල්ල ප්‍රදේශයේ 50 දෙනෙකු සහ පෙබරවාරි මස 120 දෙනෙකුට සායනය පවත්වන ලදි.

## අධ්‍යාපනික සහය, දරුවෙකුට පාසැලේ රැඳී සිටීමට උපකාර කරන්න

මෙම අවුරුද්දේදිත් සෑම ශාඛාවන්හිම දරුවන් 5 දෙනෙකු බැගින් පාසැල් බෑග් දෙන ලද. අනුග්‍රය දක්වනු ලැබුවේ ්ඬැරහදඅ ආයතනයෙන්ය. කාන්තා මිත්‍ර සංගමයෙන් පැන්සල් කවර 90 ක් සාදන ලදි.

## පරිගණක පන්තිය, කලාප කාර්යාලය හම්බන්තොට.සඳපවමඑැර

මෙම ව්‍යාපෘතිය පවත්වනු ලබන්නෙ හම්බන්තොට කලාප කාර්යාලදිය 9යේදිය.ඔයසි මෙහි අරමුණ වන්නේ කාන්තාවන් දෙදෙනෙකු පුහුණු කොට ස්වෙච්චාවෙන් මව්වරුන්ට සහ දරුවන්ට ඉගෙන්වීම කටයුතු කරගෙන යාමටයි.

## හම්බන්තොට කලාප කාර්යාලයේ ක්‍රිස්තියානි ආගම් පන්ති



සබත් පාසැලට සහභාගි වන සමහර ළමුන්ගේ පාසැලේ ආගම ගුරුවරයෙක් නොමැති බැවින් ඔවුන් පන්ති පැවැත්වීම වැදගත් යැයි හඳුනාගත් සංවර්ධන නිලධාරිනී පාසැල් නිර්දේශ අනුව දරුවන්ට ආගම උගන්වන්නට පන්ති ආරම්භ කලාය. මෙම පන්තියේ ළමයින් 12 දෙනෙක් ඉගෙනුම ලබන්නෝය.

## මව්රුන්ගේ සංගමය හා එක්ව වැඩ කිරීම.

මව්වරුන්ගේ සංගමය එක්ව නොයෙක් සභාවන් හා එක්ව වැඩ කිරීම, සත්‍යවශයෙන්ම ප්‍රිතියක් සහ ලැබුනාවු අගනා අවස්ථාවක්ය" වැන්දඹුවන් බැහැහදැකිමේ සැලැස්ම ගැන හම්බන්තොට කාන්තා මිත්‍ර සංගමය සාකච්ඡා කරන ලදි. දික්ඔය සභාවේ මව්වරුන්ගේ සංගමය මාර්තු මස 23 වන දින පැවැත්වු අතර අක්ෂි සායනය සැලසුම් කිරීම සඳහා සහයෝගයක් ලබාදුන්නාය.

## ආත්මික වර්ධනය කාන්තා මිත්‍ර සංගමයේ ඉලක්ක 1

කාන්තා මිත්‍ර සංගමයේ සාමාජිකයින්ගේ ආත්මික වර්ධනය පිලිබඳ අවධානය යොමු කරමින් **හම්බන්තොට-නිරාහාර යාච්ඤාව** සිදුකරන ලදි.

## නුවරඑළිය දිස්ත්‍රිකයේ ශාඛාවන් බැහැදැකිම



කාන්තා මිත්‍ර සංගමය කාර්යාල සේවකයින් විසින් මාර්තු මස 23 සිට 24 දක්වා ක්‍රිස්තුස් **දේවස්ථානය** දික්කොය, ශාන්ත යොහාන් දබෞතිස්ත **දේවස්ථානය,** වටවල, ශාන්ත මරියා **දේවස්ථානය,** බොගවන්තලාව, සියලු ශාන්තු වරුන්ගේ **දේවස්ථානය,** මස්කෙලිය, ශාන්ත මාගුට් **දේවස්ථානය,** කොටගල **දේවස්ථානය**, යන සභාවන් බැහැ දකින ලදි. ශාන්ත මරියා කොටගල, හැර අන් සෑම ශාකාවන්හිම වැඩ සටහන් පවත්වන ලදි. ගරු එඩ්වින් රාජ් පියතුමන් අපට දැක්වු විශේශ සහයෝගය වෙනුවෙන් අපි ස්තුතිවන්ත වන්නෙමු.

## සම්බන්ධිකාරක නිළධාරින්ගේ රැස්වීම



පළමු වතාවට කාන්තා මිත්‍ර සංගමය විසින් දික්කොය කලාප කාර්යාලයේ අප්‍රේල් 23 වන දින පවත්වනු ලැබූ රැස්වීම සඳහා උඩ රට ප්‍රදේශයේ කලාප සම්බන්ධිකාරක නිලධාරිනි සභාවේ සභාපතිතුමියන් ලේඛම්තුමියන් සහ භාණ්ඩාගාරිකතුමියන් යන මේ සියලුම දෙනාවම සාර්ථක ලෙස එක්රැස්කිරීම ගැන අපි සතුටු වන්නෙමු.

මෙය ඵලදායි රැස්වීමකි. මාතෘකාවන් කීපයක් ගැන සාකච්ජා කල අතර පළමු කාර්තුව 2024/5 සඳහා ක්‍රියාකාරකම් පෙළකස්වන ලදි“ ඉන් අනතුරුව ආහාර අනුභව සමඟම සියලු දෙනාගේ සහභාගිත්වයෙන් රැස්වීම අවසන් කරන ලදි. ඒ අය වෙනුවෙන් දෙවියන් වහන්සේගේ ආශිර්වාදය ඉල්ලා යාඥ්ඥ කරමින් ධනාත්මක වාර්ථාවන් බලාපොරොත්තු වන්නෙමු.

## අරමුදල් රැස්කිරීම



### අප්‍රෙල් වෙළඳපොළ

මෙම වාර්ෂික අලවිය අප්‍රෙල් මස 5 වන දින ධිජි ශාලාවෙදි පැවත්වුනි. වෙළඳ කුටි 35ක විවිධ භාණ්ඩ සාධාරන මිලට විකිණිමට තිබුනි. අපගේ ප්‍රදර්ශන කුටි හිමියන්ට සහ ධිජි ප්‍රදර්ශන කුටිය සඳහා දායක වු ඔබ සැමට අපගේ අවංක ස්තුතිය පුද කරමු.

### තේ ව්‍යාපෘතිය



අරමුතල් රැස් කිරිමේ පරමාර්ථයෙන් දික්කොය කලාප කාර්යාලයේ ස්වයං තේ ව්‍යාපෘතිය අප්‍රෙල් මස ආරම්බ කරන ලදි“ කරුණාකර ඔබේ මිතුරන් සහ පවුල අතර මෙය ප්‍රචාරය කරමින් සහය වන්න.

උඩරට ඊධජජ ප්‍රනිත තේ කෝප්පයක් රස විඳිමට ඔබ සැමට ආරාධනා!

ගෑම් 500 පැකට්ටුවක් රු 1,300ක් පමණයි.

ඉක්මනින් ඇනවුම් කරන්න.

දුරකථන අං: 0760964391.

## නව ව්‍යාපෘතින් - මුලස්ථානයේ කාන්තා මිත්‍ර සංගමයේ මුලු තැන් ගේ කොළ කැඳ ව්‍යාපෘතිය දියත් කිරීම

GFS හි වැඩ සඳහා අරමුදල් රැස්කිරීම මෙන්ම මහජනතාවට සේවාවක් ලෙස, GFS කුස්සිය සහ කොලකැඳ ව්‍යාපෘති පිළිවෙලින් පෙබරවාරි සහ අප්‍රේල් මාසවලදී දියත් කරන ලදි.

GFS කුස්සියෙන් සම්මන්ත්‍රණ, සාද සහ උත්සව යන අවස්ථාවන් වලට අවශ්‍ය ආහාර සපයනු ලැබේ.



# වාර්ෂික මහා සභා රැස්වීම - 2024 මාර්තු 2 වන දින

මෙම වාර්ෂික මහා සභා රැස්වීම මාර්තු 2 වන දින සෙනසුරාදා උදෑසන 10යේ සිට කාන්තා මිත්‍ර සංගමයේ ශාලාවේ පවත්වන ලදි. සභාපතිතුමිය විසින් සමාජිකයින් වෙනුවෙන් බලවත් පණිවුඩයක්ද ලේඛම්තුමිය සහ භාණ්ඩාගාරික තුමිය විසින් 2022 සහ /23 වර්ෂයට අයත් ඔවුන්ගේ වාර්ථාව කියවන ලදි.

ආරාධිත දේශකවරිය වුයේ මානව හිමිකම් පාලනය හා සංවර්ධනය ගැටළු පළිබඳ අවු 25ක පලපුරුද්ද ඇති මනෝවිද්‍යාඥවරියක් වන ෂෙහිලා රිචඩ් මහත්මියයි. වර්ථමානයේදි ඈ සිවිල් සමාජය ශක්තිමත් කරන පක්ෂයේ ප්‍රධානියාය. ඈ බයිබලය ආදේශ කරගනිමින් ධෛර්‍යමත් සහ අන් අයගේ අවදානය ගන්නා සුලු සිතුවිල්ලක් බෙදාගත්තාය. කාන්තා මිත්‍ර සංගමය විසින් ඔවුනට දිවා ආහාරය ලබා දුන් අතර සාමාජිකයින් වාර්ෂික මහා සභා රැස්වීම සතුටින් හා සහයෝගයෙන් අවසන් කලෝය



## විධායක සභාව සහ කාර්යමණ්ඩල තොරතුරු

විධයක සභාවේ ගෞරවනිය ලේකම් තුමිය වන අලෝමා ගුණසේකර මහත්මිය, 2024 පෙබරවාරි මාසයෙන් පසු ඇගේ තනතුරෙන් ඉවත් වෙන ලදි. විධායක සභාවේ සාමාජිකයෙකු ලෙස කාන්තා සංගමය වෙනුවෙන් දැක්වුවාවු සියලුම සහයෝගයන් වෙනුවෙන් අපි සියලුම දෙනා අපගේ ස්තුතිය පුදකර සිටිමු.
ඉතාමත් අනර් සේවයක් ඉටුකලාවු ව්‍යාපෘති කළමණාකාරිනිය වන ලින්ඩා යෝගේෂ්වරන් මහත්මියගේ සමුගැනිමේ සාදය කාන්තා මිත්‍ර සංගමයෙන් පවත්වන ලදි. අපි ඇගේ ඉදිරි ගමන ගැන සුබ පතන්නෙමු.

අවුරුදු 10 ක කාලයක් තිස්සේ ජේෂ්ඨ විධායක නිලධාරිනි ලෙස සේවය කල උදේශිකා ද සිල්වා මහත්මිය ශ්‍රි ලංකා සයුරෙන් එතෙර වුන බැවින් ඇට අපි "සයොනාරා" සුභ ගමන් ලෙස පැවසු අතර ජපානයේ ඇගේ අලුත් රැකියාවේ සාර්ථකත්වයටද සුභ පැතුවෙමු.



දික්ඔය කලාප කාර්යාලයේ සහය සම්බන්ධකරන නිලධාරිනි ලෙස සේවයේ නියුක්තව සිටි අබියා අන්බරසු මෙනෙවිය වෙනුවෙන්ද සමු ගැනිමේ සාදයක් පවත්වනු ලැබු අතර ඇගේ ඉදිරි අධ්‍යාපන කටයුතු සාර්ථක වන ලෙස සුභ පැතවෙමු

අත්දැකිම් යුක්ත කාන්තාවන් දෙදෙනෙක් වන මර්සි අරුලානන්දම් මෙනෙවිය මුලස්ථානයේ ව්‍යපෘති සම්බන්ධකරණ නිලධාරිනි, සහ පේමිමා මෝසෙස් මහත්මිය දික්ඔය කලාප කාර්යාලයේ සම්බන්ධකරණ නිලධාරිනි වශයෙන්ද අපි පිළිගත්තෙමු. ඔවුන් දෙදෙනාටම සතුටුදායක ගමනකට කාන්තා මිත්‍ර සංගමයෙන් සුබ පැතුම් එක්කරන්නෙමු.

## විධායක සභාව

**පින් විතානගේ මහත්මිය**
කාන්තා මිත්‍ර සංගමයේ ලෝක සභාවේ සභාපතිනිය

රෝහිණී රත්නම් මහත්මිය
සභාපතිනිය

සුගී ජෙබමනී මහත්මිය
උප සභාපතිනිය

මාසියා සෙනෙවිරත්න මහත්මිය
උප සභාපතිනිය

නිමාලී ගජසිංහ මහත්මිය
ගරු භාණ්ඩාගාරික

ජීන් තිසේවරසිංහ මහත්මිය
සහකාර ලේකම්

ක්‍රිෂාන්ති මැනුවෙල් මහත්මිය
සහකාර භාණ්ඩාගාරික

## කාර්ය මණ්ඩලය

දේවිනි තිසාරච්චි
ප්‍රධාන විධායක නිලධාරිනි

ගයාත්‍රි ජජමන්ගේ
කළමනාකරු-පරිපාලන සහ මූල්‍ය කටයුතු

සරිතා ප්‍රනාන්දු
විධායක - ශිණුම් සහ ව්‍යාපෘති

මර්සි අරුලානන්දම්
කොළඹ මුලස්ථාන සම්බන්ධකාරක නිළධාරිනි

තුෂාරි ප්‍රනාන්දු
සංවර්ධන නිලධාරීනි

**පේමිමා මෝසේස්**
දික්ඔය කලාප කාර්යාල සම්බන්ධකාරක නිළධාරිනි

58, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 03
+94 11 2 573214-5 / 011 2 573223
gfsofsrilanka@gmail.com
FB – Girls' Friendly Society, Sri Lanka
GFS Hall, Colombo 03
GFS Sri Lanka : Women helping Women